# මගේ තාත්තා



1988 නොවැම්බරය භීෂණයෙන් පිරුණු සමයකි. එතැන් සිට කාලය වේගයෙන් ඉක්ම ගොසිනි. ඒ භීෂණයේ සිදුවීම් අද වන විට බොහෝ දෙනකුට අමතකව ගොස් තිබේ. 88-89 කාලය තුළ අතුරුදහන්වූවන් ගැනත්, මරා දැමුවන් ගැනත් අපි '90 දී කතා කළෙමු. මරණය දැක දැක මරා දැමුවන් වෙනුවෙන් ගුණ සමරු උත්සව පැවැත්විණි. මට අදටත් ඔවුන් ගැන ඇත්තේ ගෞරවයකි. මා හැදී වැඩී පෝෂණය වුයේ භීෂණය පිරුණු සමාජයකය. ඒ අවදියේ බොහෝ මිනිසුන් මරා දැමුවේ ඉතාමත් ම්ලේච්ඡ ආකාරයටය.

මා හැදී වැඩුණු ඒ භීෂණකාරී සමාජය අද ද ජීවමානව පවතී. මා මේ ලිපිය ලියන්නේ එබැවිනි. අතීත මතකයන් තුළින් මට ගැලවීමක් නැති බැවිණි.

වාමාංශිකයෙකු වූ මාගේ තාත්තා 1988 නොවැම්බර් 08 දා ජනතා විමුක්ති පෙරමුණ විසින් ඝාතනය කරන ලදී. ඔහු නමින් නන්දසේන සිල්වාය. ජීවිතයේ තිස් නම වැනි අවුරුද්දේදී ඔහු මරා දමන විට මා කුඩා දැරියකි. මා දන්නා පරිදි ඔහුගේ දේශපාලනය ආරම්භ වන්නේ 1971 කැරැල්ලට සමගාමීවය. ඒ 1971 කැරැල්ලට සම්බන්ධ වුවන් හා ඔහු අතර වූ දේශපාලන මිතුදම් නිසාවෙනි. මාගෙ මතකයන් අතරේ ඔහු ඉතාමත් ප්‍රිය ජනක, සමාජයේ අනිත් මිනිසුන් උදෙසා වැඩ කළ පුද්ගලයෙකි.

1980 වැඩ වර්ජනයට හසු වූ ඔහු, බණ්ඩාරවෙල ඌව කරඳගොල්ලේ ගොවිපළක් ආරම්භ කරන ලදී. ගොවිපළ ඇරඹීම හරහා වැඩ වර්ජනයට හසු වූ ඔහුගේ ඇතැම් මිතුරන්ටද ජීවන මාර්ගයක් සැපයීමට හැකිවීම ගැන ඔහු සතුටු විය. ඌව කරඳගොල්ලේ පාසල ගොඩ නැගීමට ඔහු වෙහෙස මහන්සිව කටයුතු කළේය. උසස් පෙළ ළමුන්ට නොමිලේ අමතර පන්ති පැවැත්වීමත් ඔහු විසින් ආරම්භ කරන ලදි. ගමේ සෙසු ළමුන් මෙන් දුෂ්කරතා විඳින්නට පුරුදු වෙන්නැයි කී ඔහු මුලින් කරඳගොල්ල ගමේ ඉස්කොලෙට අප යැවීය. තාත්තා පාසැලට උදව් කළ නිසා අප කෙරෙහි විශේෂ සැළකුම් දක්වනු දැකීම ඔහු ප්‍රිය නොකළේය. පාසැල් නාට්‍ය සඳහා මා දෙවරක්ම තෝරා ගැනීම රුචි නොකළ තාත්තා පාසැලට ගොස් 'හැකියාව තිබෙන වෙනත් දරුවෝ මේ පන්තියේ නැතිදැ'යි ඇසූ අයුරු මට අද මෙන් මතකය. මිනිසුන්ට ආදරයෙන් සළකන්නට මට කියා දුන්නේ තාත්තාය. ගොවිපොළ හරහා යනෙන ගම් වැසියන් නවතා කොළඹින් ගෙනා විටමින් සහ යකඩ පෙති තාත්තා බෙදා දෙන අයුරු මට දැනුදු මතකය. 1983 කලු ජූලිය අවදියේ අපේ ගෙදර දෙමළ මිනිසුන්ගෙන් පිරී තිබිණ. තාත්තා හැකි හැම විටකම අන් අයට උදව් කළේය. නමුත් ඔහුගේ සමාජ ක්‍රියාකාරීත්වයන් ගැන අපට ඒ අවදියේ ගැඹුරු අවබෝධයක් නොතිබිණ.

ජනතා විමුක්ති පෙරමුණ විසින් 1988 නොවැම්බර් 08 දින මාගේ තාත්තා සාහසික ලෙස මරා දැමීමට ප්‍රධාන හේතුව වුයේ වාමාංශික මත දරන්නෙක් ලෙස එවකට ජනතා විමුක්ති පෙරමුණෙහි දේශපාලනය ඔහු ප්‍රසිද්ධියේ හෙළා දුටු හෙයිනි. ඔහු ජාතිවාදයට සහ පුද්ගල ඝාතනයට එරෙහිව විවෘතව කතා කළේය. නන්දන මාරසිංහ සහ විජය කුමාරතුංග ඝාතනයන් ඔහු ප්‍රසිද්ධියේම හෙළා දැක්කේය. මාරසිංහ ඝාතනයෙන් පසු, තාත්තා නන්දන මාරසිංහයන්ගේ විශාල සේයාරුවක් ගේ ඉදිරිපස එල්ලා ඒ ගැන ශෝකයෙන් කතා කළ බව මට මතකය. ළදැරියක වූ මම මාරසිංහ යනු කවරෙක්දැයි ගැඹුරින් දැන නොසිටියෙමි. නමුත් තාත්තාගේ වේදනාව තුළින් ඔහු පිළිබඳව මා තුළ චිත්‍රණය වූ රුව දැනුදු මතකයේ තැන්පත්ව තිබේ.

තාත්තා නිතර තමන්ගේ මරණය ගැන කතා කළේය. නමුත් ඔහු වීරයෙක් නිසා ඔහු නොමැරෙනු ඇතැයි මම සිතීමි. මාගේ කුඩා ලෝකයේ අපරාජිත වීරයා වූයේ මගේ තාත්තාය. ඔහු මරා දැමිය හැක්කේ කාටද? ඇතැම් විටක මා තුරුළට ගෙන මාක්ස්ගේ හෝ ලෙනින්ගේ කෘතියක් හඬ නගා කීමට ඔහු පුරුදුව සිටියේය. මට එහි කිසිත් නොතේරිණ. නමුත් මම ඔහේ අසා සිටියෙමි. කුඩා කාලයේ සිට ඒවාට අපේ කණ හුරු කරනු වස් ඒවා කියවන්නේ යැයි වරක් ඔහු කී බව මට මතකය. ඔහු ලෝකය දකින ආකාරය පුංචි මා සමඟ බෙදා ගත්තේ ඔහු ගේ මරණය දැන සිටි නිසා යැයි මට අද වැටහේ.

ජනතා විමුක්ති පෙරමුණ විසින් ඝාතනය කළ මගේ තාත්තා එවන් මිනිසෙකි.

මා සහ අක්කා අවසන් වරට තාත්තා දුටුවේ නොවැම්බර් 03 වෙනිදා පාසැල් නේවාසිකාගාරයේදීය. ඉන් පස් දිනක් ඇතුළත ඔහු මරා දැමිණ. ඔහු සමඟින් තවත් 04 දෙනකු ඝාතනයට ලක් විණ. දෙදෙනකු යාබදව තිබූ ගොවිපලවල් හී අයිතිකරුවෝ වූහ. ඒ දෙදෙනාම

දෙමළ ජාතිකයන් වූ අතර කිසිදු ක්‍රියාකාරී දේශපාලනයක් නොකළවුන්ය. ඔවුන් දෙදෙනා ඝාතනය කරන ලද්දේ කුමන හේතුවක් නිසා දැයි මම අද ද නොදනිමි. අනෙක් දෙදෙනාගෙන් අයෙක් ගොවිපොළේ කටයුතු සඳහා අත් උදව්වට හොරණ ප්‍රදේශයේ සිට ආ වඩු කාර්මිකයෙකු වූ රෝහණය. දෙවැන්නා වුයේ ජයවර්ධන අන්කල්ය. (ඔහු වාමාංශික ක්‍රියාකාරිකයෙකු වූ වසන්ත දිසානායකයන්ගේ බාල සොහොයුරාය.) ජයවර්ධන අන්කල් එවකට කටුබැද්ද විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ ශිෂ්‍යයෙක් විය. සරසවි වසා දැමීම හේතුවෙන් ගෙදරට වී සිටි ඔහු වෘත්තියෙන් ගෘහ නිර්මාණ සැළසුම්කරුවෙකු වූ මගේ තාත්තාගෙන් ප්‍රායෝගික දැ උගෙනීමට අපේ ගෙදරට විත් සිටි බව මට මතකය. ඔවුන් සියල්ලෝ අපේ නිවස තුළදීම අමු අමුවේ මරා දැමිණ. අනතුරුව නිවස මුළුමණින්ම ගිනිබත් කරන ලදී. සුරතලයට ඇති කරන්නට යැයි කියා රාවණාඇල්ලේ තාත්තාගේ මිතුරෙකු මට ගෙනවිත් දී තිබූ මුව පැටවාද මරා දමා තිබිණ.

මරණයට පෙර තාත්තාට වධ දුන්නා දැයි මම නොදනිමි. ජයවර්දන අන්කල් ගේ දකුණු අත කපා වෙන් කොට, තාත්තාගේ කඳින් වෙන් කළ හිස සමග අප නිවසට එන ප්‍රධාන පාරේහි ගසක එල්ලා තිබිණ. ඔහු වෙනුවෙන් අවමගුල් චාරිත්‍ර තහනම් කළ ඝාතකයින් එසේ කළහොත් අපෙන් පළිගන්නා බවට තර්ජනාත්මකව දන්වා තිබිණ. මටත්, අක්කාටත් තාත්තාගේ අවමංගල්‍යය තහනම් අඩවියක් විණ. ඔහු අපෙන් සමු නොගත්තේය. ඔහුගේ මුහුණ සිඹ සමු දෙන්නට මටත් අක්කාටත් නොහැකි විය. මට ලෝකය සහ ආදරය ගැන කියා දුන් තාත්තා ඒ තරම් බිහිසුණු මරණයක ගොදුරක් වූයේ ඇයි? ජනතා විමුක්ති පෙරමුණේ නායකයින්ගෙන් මට අදත් අසන්නට ඇති ප්‍රශ්නය එයයි.

ගිනිබත් කොට දැමූ ගේ දොරට යට වී ළමා විය පිළිබඳ මාගේ සියළු මතක සටහන් දැවී හළු විය. අඩුම වශයෙන් තාත්තාගේ සේයාරුවක් හෝ අපට ඉතිරි නොවිණ. එදා ජනතා විමුක්ති පෙරමුණෙහි දේශපාලනය විවේචනය කළ පුද්ගලයින්ට ඔවුන් දුන් දඬුවම් එබඳු ය. ඒ ඝාතකයෝ අද වුවද නිදැල්ලේ හැසිරෙමින් සිටින බව මම දනිමි. ඒ රුධිරයේ වගකීමෙන් වත්මන් ජවිපෙ නායකයින්ට ගැළවී ගත හැක්කේ අප සමාජයක් වශයෙන් ශිෂ්ඨත්වයක් නොපෙනෙන මානයක ජීවත්වන බැවිනි. මගේ තාත්තාගේ ඝාතකයන්ට එරෙහිව නැගී සිටිය යුත්තේ කෙසේ දැයි මම අදටත් නොදනිමි.

තාත්තාගේ මරණයෙන් පසුව ඔහුගේ දේශපාලන මිතුරෝ තැන තැන ගෙනයමින් අනේක දුෂ්කරතා මැද අපව සඟවා රැක බලා ගත්හ. ඒ මනුෂ්‍යත්වයට මම අදද ගරු කරන්නෙමි. අපේ ළමා විය පලා යා නොහැකි නපුරු සිහිනයක් විණ. අකාරුණික ලෝකය පිළිබඳ අඳුරු සිතුවම අපේ හදවත් පතුළටම කිඳා බැස්සේ ඒ කුඩා වියේදීමය. තාත්තාගේ දේශපාලන මිතුරෙකු මා සහ අක්කාට රැකවරණය දෙමින් අපව නඩත්තු කොට ජීවිතය ගොඩ නගා නොදෙන්නට, අපට කුමක් වනු ඇතිදැයි මට සිතාගත නොහැකිය.

යුක්තිය සහ ශිෂ්ඨත්වය අහිමි වූ රටක මරා දැමූ එක් හොඳ මිනිසෙකු වූ තාත්තා පිළිබඳ මතකය වෙනුවෙන් මේ හැර මා වෙන කුමක් ලියන්නද?

මේ ලිපිය අවසන් කිරීමට පෙර තවත් යමක් ලිවීමට කැමැත්තෙමි. මාගේ පියාගේ මුල්කාලීන දේශපාලන මිතුරෝ විවිධ වූ සමාජ කාර්යයන්හි මේ දක්වා නිරත වෙති. ඒ බොහෝ දෙනෙකුට ඔවුන්ගේ වූ මාවත් හමු වී තිබේ. අහම්බෙන් හෝ අප හමු වූ විටක 'මේ නන්දේ ගේ දුව - මේ අර සහෝදරයා ගේ දරුවා'යි කියා සෙනෙහසින් අමතති. නමුත් අප හදවත් තුල මිරිකෙමින් පවතින වේදනාව ඔවුන්ට දැනේදැයි මම නොදනිමි. හොඳ මිනිසෙක් වූ මාගේ තාත්තා මරා දැමුණේ ඇයිදැයි අපට පහදා දෙන්නට ඔවුන්ටද නොහැකි වී තිබේ. ඒ මහා වේදනාව අප විසින් අපගේ මරණය දක්වා දරාගෙන යා යුතුව ඇත. කිසිවෙක් කිසිදු පිළිතුරක් දීමට උත්සාහ නොගනී. ඒ වේදනාවෙන් නිදහස් වීමට අපට උදව් නොකරයි.

කිසිම කෙනකුට කිසිම කෙනකු මැරීමට අයිතියක් නොමැති බව මගේ හැඟීමයි. යම් කිසි ඝාතනයක් සිදු වූයේ ඇයි දැයි යන ප්‍රශ්නය ඇසීමට ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක අයිතියක් තිබිය යුතුය. අදටත් ලංකාව තුළ දකුණේ හා උතුරේද විරුද්ධ මත දරණ පුද්ගයන් මරා දමන බව මම දනිමි.

රුවන්දි සිල්වා
(නන්දේ ගේ දුව)
ruwandi@gmail.com

> තාත්තා නිතර තමන්ගේ මරණය ගැන කතා කළේය. නමුත් ඔහු වීරයෙක් නිසා ඔහු නොමැරෙනු ඇතැයි මම සිතීමි. මාගේ කුඩා ලෝකයේ අපරාජිත වීරයා වූයේ මගේ තාත්තාය. ඔහු මරා දැමිය හැක්කේ කාටද? ඇතැම් විටක මා තුරුළට ගෙන මාක්ස්ගේ හෝ ලෙනින්ගේ කෘතියක් හඬ නගා කීමට ඔහු පුරුදුව සිටියේය. මට එහි කිසිත් නොතේරිණ. නමුත් මම ඔහේ අසා සිටියෙමි. කුඩා කාලයේ සිට ඒවාට අපේ කණ හුරු කරනු වස් ඒවා කියවන්නේ යැයි වරක් ඔහු කී බව මට මතකය. ඔහු ලෝකය දකින ආකාරය පුංචි මා සමඟ බෙදා ගත්තේ ඔහු ගේ මරණය දැන සිටි නිසා යැයි මට අද වැටහේ.
>
> ජනතා විමුක්ති පෙරමුණ විසින් ඝාතනය කළ මගේ තාත්තා එවන් මිනිසෙකි.......

33 වන පිටුවෙන් (හද රිදවන මතක)

සහගත බවය. එසේම මීට පෙර දේශපාලන මණ්ඩලය විසින් ඇතැම් සහෝදරවරු අවිවාහකව සිටියදී පවා එවැනි සම්බන්ධතා පවත්වා ගෙන යෑම වැරදි සහගත යයි තීන්දු කොට තිබෙන බවත් දේශපාලන මණ්ඩල සභිකයන් විසින් පෙන්වා දෙන ලදහ. පක්ෂයේ සාමාජිකත්වය විසින් මෙම සම්බන්ධතාවය ගැන මතු කර තිබෙන කරුණු සැලකිල්ලට ගෙන පරීක්ෂණයක් පවත්වා තීන්දුවක් ඉදිරිපත් කිරීමේ කටයුත්ත ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් වරයා වශයෙන් මා වෙත පැවරුනි.

මොරින් සහෝදරිය යනු "පක්ෂයේ රහස් දැන ගැනීමට, පක්ෂයේ නායකයන් බිලී බා ගැනීමට, රෝහණ සහෝදරයාට වසදී ඝාතනය කරන්නට හතුරන් විසින් යොදවන ලද ඔත්තු කාරියක්" ය යන කථාවත්, රෝහණ සහෝදරයාට මුහුණ සෝදා ගැනීමට තබන ලද වතුර බේසමෙන් දිය බිව් පොල් කිච්චෙක් එතැනම මැරී වැටුණු කථාවත් ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකත්වය තුල වේගයෙන් පැතිරී යන්නට පටන් ගත්තේ මෙවැනි වාතාවරණයක් පවතිද්දීයි. මෙම සිද්ධිය ගැනත්, පක්ෂයේ ප්‍රධාන ලේකම්ගේ තීන්දුව ගැනත් ලබන කලාපයෙන්.